# රන්මසු උයනේ ගෘහ නිර්මාණ ශිල්පය සහ සංකේතවාදය සඳහා තාන්ත්‍රික බෞද්ධ ආභාසය

රවීන්ද්‍ර ඒ. බණ්ඩාර[1], පාහියංගල සුමංගල හිමි[2]

## හැඳින්වීම

මහාමේඝ වනය භික්ෂු සංඝයාට පූජා කිරීමෙන් පසු ශාසනමාමක වූ රජ වරුන්ගේ ලෞකික සුඛ විහරණය සඳහා ස්ථානයක් නොවූ හෙයින්ම මහාවිහාරයට දකුණු දෙසින් ස්වර්ණ වර්ණිත මධ්‍යයන්ගෙන් යුක්ත උද්‍යානයක් කරවූ බව සඳහන් වන අතර, එය රන්මසු උයන ලෙස නිත්‍ය නාමකරණයෙන් හැඳින්වූ බව හතරවන මහින්ද රජුගේ වෙස්සගිරිය පූරු ලිපිය සාක්ෂි දරනු ලබයි (E.Z.Vol.1.P.17-18). වාස්තු විද්‍යාත්මක අතින් ලෞකික සුංගාහාර රසයට මනා පසුබිමක් සපයන රන්මසු උයන රාජකීයයන්ගේ ප්‍රමෝදය සහ සුඛාස්වාදය සඳහා වූ ක්ෂේම භූමියක් විය. එහෙත්, රන් මසු උයනේ භූමි ශාස්ත්‍රීය භාවය හා ජල කළමනාකරණය ද සක්වල චක්‍රය හා මෙහි තිබී හමු වූ මූර්ති ද හුදෙක් භෞතික අලංකරණවාදයෙන් ඔබ්බට ගිය දාර්ශනික මෙන් ම විශ්වවිද්‍යාත්මක ආගමික පදනමක් මත ගොඩනැගී ඇති අයුරු විදර්ශනය වන අතර, එකී ප්‍රත්‍ය ගම්‍ය සාධකවල ප්‍රාරම්භය ක්‍රිස්තු වර්ෂ 7-10 අතර කාලසීමාවේ ලංකාවේ බුදු දහම තුළ විද්‍යමාන වන මහායානික අදහස් සහ එහි පරිණාමීය අවධියක් වූ වජ්‍රයාන හෙවත් තාන්ත්‍රික බුදු දහමේ බලපෑම විද්‍යමාන වන බව පෙනේ (රාහුල, 2020, පි. 82).

## පර්යේෂණ ගැටලුව

රන්මසු උයනේ නිර්මාණ ශෛලය තුළ තාන්ත්‍රික බුදු දහමේ විශ්වවිද්‍යාත්මක හා ගුප්ත ආගමික සංකේතවාදය නිරූපණය වූයේ ද?

## පර්යේෂණ අරමුණ

රන්මසු උයනේ නිර්මාණ ශෛලය තාන්ත්‍රික චින්තනය හා අනුරූප වන අයුරු අධ්‍යයනය කිරීම

## පර්යේෂණ ක්‍රමවේදය

සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය හා රන්මසු උයනේ ගෘහ නිර්මාණ ශෛලයත් එහි සංකේතාත්මක සාධක යන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අධ්‍යයනය කිරීම

1 දර්ශන විශාරද උපාධි අපේක්ෂක, පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය. ravindrabandara@2019gmail.com

2 සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

පුරාණ ලාංකික වාස්තු විද්‍යා ශෛලය හුදෙක් ථෙරවාදී සම්ප්‍රදාය සමඟ අර්ථනිරූපණය කිරීම ජනප්‍රිය මතවාදය වුවත් ඇතැම් ගෘහ නිර්මාණ ශෛලීන්හි ථෙරවාදී සම්ප්‍රදායෙන් එපිටට ගමන් කරනු ලබන දාර්ශනික මූලයන් හඳුනාගැනීමට හැකිවන අතර එම මූලයන් රන්මසු උයනේ ගෘහ නිර්මාණ ශිල්පය සහ සංකේතවාදය තුළින් හඳුනාගැනීමට හැකිය.

දේවානම්පියතිස්ස රජු මහමෙව්නා උයන සංඝයාට පූජාකළ පසු රාජකීයන්ගේ සුඛ විහරණය සඳහා මතු වූ අවශ්‍යතාවය නිසා මහා විහාර භූමියට දකුණු දෙසින් රන්මසු උයන ඉදිකළ බව පැවසේ. මෙහි ස්වර්ණ වර්ණිත මත්ස්‍යයන් සිටින බැවින් රන් මසු උයන නම් වූ බව පැවසේ (පරණවිතාන, 2015. පි.384).මේ ස්ථානයට දහවන සියවස වන විට රන්මසු උයන යන නම නිත්‍ය ලෙස ම භාවිතා වූ බව IV වන මිහිඳු රජුගේ වෙස්සගිරි පුවරු ලිපියෙන් සනාථ වේ (E.Z.VOI.I.P.17-18). රන්මසු උයන දුටුගැමුණු රාජ්‍ය සමය සමඟ බද්ධ වන බව ජනප්‍රවාදගත කථාවේ සඳහන්වේ. දුටුගැමුණු මහරජුගේ පුත් සාලිය කුමරුට අශෝකමාලා පළමුවරට මුණගැසුනේ මෙම උයනේ දී බව කියැවේ. අශෝකමාලා විසූ සැඩොල් ගම වූ "හෙල්ලෝලා ගම" මේ සමීපයේ පිහිටියේය. රන්මසු උයනේ තිබී හමු වී දැන් ඉසුරුමුණි විහාරයේ තැන්පත් කර ඇති පෙම් යුවල සම්බන්ධව ඇති එක් මතයක් වන්නේ ද එයින් සාලිය හා අශෝකමාලා නිරූපණය වන බවයි. නමුත් මෙය ලෞකික සෘංගාරය නිරූපණය වන තාන්ත්‍රික ඉරියව්වක් බව පෙනේ.

මහාවංසයේ වසභ රාජ්‍ය සමය ගැන සඳහන් කරන තැන, "ගෝ පුරුඤ්ච චතුද්වාරේ මහා වත්ථුඤ්ච කාරයි සරං කාරේසි උය්‍යානේ හංසේ තත්ථ විසජ්ජයි" (ම.ව.පරි.35 ගාථා.97) "පුරේ බහු පොක්ඛරදී කාරාපෙත්වා තහිං තහිං උම්මග්ගේන ජලං තත්ථ පවේසේසති මහීපති"(එම, ගාථා.98) උමං ජලමාතික ක්‍රමයකින් සොරොව්වකින් ජලය ගෙන එය පිර වූ බව ද සඳහන්වේ. මෙලෙස මහාවංසය සඳහන් කරන්නේ රන්මසු උයන සම්බන්ධවිය හැකිය.

පුරාවිද්‍යාඥයන්ගේ සොයා ගැනීම්වලට අනුව, රන්මසු උයන තිසා වැවේ ජල මට්ටමට අඩි 30 ක් පමණ යටින් පිහිටා ඇත. මඟුල් උයන් නමින් හඳුන්වනු ලබන මෙම උයන අක්කර හතලිහක පමණ භූමි ප්‍රමාණයක් පුරා ව්‍යාප්තව පවතින බව ද සොයා ගෙන තිබේ. ක්‍රි.ව. 1901 දී පමණ මෙම ස්ථානය කෙරෙහි අවධානය යොමු කරන ලද්දේ එච්.සී.පී.බෙල් මහතාය. ඔහු මෙම ස්ථානය හෙළි පෙහෙළි කර කැන බලා ඒ නටඹුන් පිළිබඳව තරමක විස්තරයක් එම අවුරුද්දේ පුරා විද්‍යා වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර තිබේ. නමුත්, මෙහි විධිමත් පුරා විද්‍යා සංරක්ෂණ කටයුතු පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් බාරගනු ලැබුවේ 1940 වර්ෂයේ දීය. ඉන්මතු, 1946 දී තිසා වැවට පහළින් ඇති මේ රාජ උද්‍යානයේ නෂ්ටාවශේෂ ආරක්ෂා කරවීම සඳහා කටයුතු යොදන ලදී. ඒ අනුව, උයනේ උතුරු කොනේ අටපට්ටම් මණ්ඩප තුන පිහිටි ආයත චතුරස්‍ර භූමිය වටා වූ දිය අගලේ පැතිවල ගල් බැම්ම නැගෙනහිර කොටස් සම්පූර්ණයෙන් අලුතින් ප්‍රකෘතිමත් කර තිබේ. සාමාන්‍යයෙන් ක්‍රි.ව. 1947 පමණ වන විට පොකුණ ප්‍රකෘතිමත් කර නිමවීමට හැකිවී තිබේ (පරණවිතාන, 2001. පි.40-42).

අනුරාධපුර යුගයේ විශිෂ්ට ජල කලමනාකරණ ක්‍රමවේදය අද්විතීය නිමවුමක් ලෙස රන්මසු උයන හැඳින්විය හැකිය. තිසාවැවෙන් රන්මසු උයනට ලබාගන්නා ජලය උද්‍යානය පමණක් අලංකරණය කර අපතේ යැවීමට ඉඩ හැරියේ නැත. එය විධිමත් කලමනාකරණයකින් ආපසු කෙත්වතු වෙත හරවා යවන ලද බව IV වන මිහිඳු රජුගේ වෙස්සගිරිය ශිලා ලේඛනයේ මෙලෙස සඳහන්වේ. "අවට එක්සියසු සාලියේ කිරි එක් පයක් කුමබුරට් දාන වවැකින් මොහොල්නගැදේ සොරො පෙරෙටැ සතර රියනක් දියටි හින්ද වූ දිය කැටැ පහණ් මුඳුන පැනෙනතාක් ඩහක් නැතිවැ දිය පවත්වනු ඉසා මෙසෙ පවත්වන දිනය රන්මසු උයන ඉසා කෙල ගෙය ඉසා උයන් ගෙය ඉසා මහනෙල් තෙය ඇතුළුවැ මෙතුවක් තැනට් හා වෙහෙර අවටැ පෙරකී කුමබුරට් පවත්වනු..." (E.Z.VOI.I.P.17-18) ඒ අනුව, "තිසා වැවේ එම දියෙන් වගා කෙරෙන්නා වූ වෙහෙර අවට පිහිටි කිරිස 144 කුත් එක් පසක් කුඹුරට දාන වැවකින් මොහොල්නග රාජ සොරොව්ව ඉදිරිපිට සතර රියනක් දියයට හින්ද වූ දියකැට පහණෙහි මුදුන පෙනෙන තෙක් බාධාවක් නැතිව ජලය බෙදා දීම පිණිසත් මෙසේ බෙදා දෙන ජලය රන්මසු උයනටත් තවාන් ගෙයටත් උද්‍යාන තටාකයටත් මහනෙල් තටාකයටත් ඇතුළු මේ තාක් තැනටත් වෙහෙර අවට පිහිටි පෙරකී කුඹුරටත් සපයනු පිණිසත් එසේ නැතුව ජලය කොළොම්බි ඇළට යොමු කොට බැහැරට යවා සංඝයා වහන්සේට අලාභ නොකරනු පිණිසත්..." යනුවෙන් එහි වූ විවිධිමත් ජල කලමනාකරණ ක්‍රමවේදය මනාව පෙන්වයි. තිසා වැවෙන් ජලය ගෙන රන්මසු උයන ද තවාන් තටාකය උද්‍යාන තටාකය, මහනෙල් තටාකය ආදිය පුරවා කිරීස සියගණන් කුඹුරුවලට ද ජලය බෙදා හැර තිබේ. පරිසර අලංකරණය උද්‍යානකරණය මෙන් ම, මනා ජල කලමනාකරණයක් පුරාණ සිංහලයා සතු බව මෙයින් මනාව පෙනේ. රන්මසු උයනේ ජල කලමණාකරණ සැලැස්ම මිනිස් සිරුරේ ස්නායු පද්ධතියට සමාන බව "මේ පොකුණු අවට ඇති ජලමාර්ග ක්‍රමය දෙස බලන විට සුප්‍රකට ආයුර්වේද ග්‍රන්ථයක් වන "සුශ්‍රැතයේ "එන සැඳහුමක් සිහියට එයි. එහි මිනිස් සිරුරේ ස්නායු පද්ධතිය සමාන කර ඇත්තේ උයනක ඇති සංකීර්ණ ජලමර්ග ක්‍රමයටයි." යනුවෙන් පරණවිතාන මහතා කරනු ලබන ප්‍රකාශයෙන් සනාථ වේ (පරණවිතාන, 2001. පි.43).

ජලමනාකරණයත් එහි භූමි සැකසුම ද පරිසර බද්ධතාවය ද පොකුණෙහි පිහිටා ඇති ජ්‍යාමිතික රටාව ද සත්‍යවශයෙන් ම අහඹු නිර්මාණයක් නොවන අතර පර්වත ගුහා ජලය යන සාධක එකිනෙක යා කරමින් කර ඇති නිර්මාණ තාන්ත්‍රික චාරිත්‍ර ඉටු කරනු ලබන ශුද්ධ භූමියක සැලැස්මට බෙහෙවින් සමාන වේ. විශේෂයෙන්ම තාන්ත්‍රික ග්‍රන්ථයක් වන මංජු ශ්‍රී කල්පයට අනුව ජලය සහ ගල්පර්වත ආශ්‍රිත නිෂ්ශබ්ද ස්ථානය ධරණී මන්ත්‍ර ජීවම් කිරීමට හා මණ්ඩල සැකසීමට වඩාත් උචිත ස්ථාන ලෙස සැලකේ (රවීන්ද්‍ර, 2020. පි.395). ක්‍රිස්තු වර්ෂ අට නමය සියවස්වලට අයත් සංස්කෘත ලිපිවල ධරණී මන්ත්‍ර හා තාන්ත්‍රික ශ්ලෝක අන්තර්ගත වීමෙන් උපයුක්ත මතය සනාථ වේ. විශේෂයෙන්ම තාන්ත්‍රික චින්තනයක් තුළ රාජකීය උද්‍යාන නිර්මාණය රජුගේ දිව්‍යමය හා විශ්වීය බලය පෙන්වීමට කරනු ලබන නිර්මාණ ලෙස සැලකේ (රාහුල, 2020, පි. 82). එමෙන්ම රන්මසු උයනේ ඇති සක්වල චක්‍රය තුළින් වජ්‍රායනයේ කාලචක්‍ර මණ්ඩල හෝ ගර්භ ධාතු මණ්ඩලය නිරූපණය වන බව යෝජනා කළ හැකිය. එහි මත්ස්‍යයන් ආදී සත්වයන්ගෙන් සංසාර සාගරය තරණය කිරීමේ පළමු පියවර ද කේන්ද්‍රයේ ඇති කවය මගින් මහාමේරුව හා එහි ඇති විශ්ව බලවේගය නිරූපණය වන බව ද යෝජනා

කළ හැකි අතර ජ්‍යාමිතික කොටු සහ කුරුස සංකේතය මන්ත්‍ර අක්ෂර ලිවීම සඳහා භාවිතා කරන ලද සංකේත ලෙස ද හඳුනාගත හැකිය. මෙම චක්‍රය කොටා ඇති ස්ථානය නිරූපණයට භාජනය කරන විට පෙනී යන්නේ එය ඉදිරිපිට භාවනා කළ හැකි ශෛලමය අසුනක් පවතින බවයි.

රන්මසු උයන පැහැදිලි ලෙස ම රාජකීයන්ගේ සුඛ විහරණය සඳහා නිර්මාණය කරන ලද්දක් බව එහි වාස්තු විද්‍යාත්මක මෙන් ම, උද්‍යානකරණය දෙස බලන විට අනිවර්යයෙන් ම පසක් වන කරුණකි. රාජකීයන්ගේ විනෝදය ජල ක්‍රීඩාව යනාදී අවශ්‍යතා මෙයින් මනාව නිරූපණය විය. රජු උද්‍යාන කෙලියේ බිසෝවරු හා පරිවාර කාන්තාවන් සමඟ මෙම භූමියේ දී ජලස්නානය කර විනෝදවීම සිදුවිය. සත්‍යවශයෙන් ම සකල අනුරාධපුරය පුරා ව්‍යාප්තව ඇති ආගමික ගොඩනැඟිලි මධ්‍යයේ ඇති ඒකාකාරි බව බිඳෙන්නේ ද මෙම රන්මසු උයන නිසාය. ලෞකිකත්වය, ශෘංගාරය, රසවින්දනය යනාදී අංශයන් කෙරෙහි අවධානය යොමු කිරීම රන්මසු උයනෙන් සිදුවිය. ඒ බවට මෙහි තිබී හමු වී දැන් ඉසුරුමුණියේ තැන්පත් කර ඇති පෙම් යුවල ඇතුළු කැටයම් ද දෙස් දෙයි. මේනිසාම මෙම ස්ථානය සාමාන්‍ය ජනයාට විවෘත නොවූ රාජකීයයන් සඳහා වෙන් වූ කුණ්ඩලිනී යෝගය ඇතුළු තාන්ත්‍රික යෝග පුහුණු කරන ලද ස්ථානයක් ලෙස හඳුනාගත හැකිය.

එමෙන්ම ක්‍රිස්තු වර්ෂ 8-10 සියවස්වල රජ කළ පළමුවන සේන දෙවන සේන හතරවන මහින්ද වැනි රජවරු තාන්ත්‍රික ආභාසය ලබා ගත් බවට සාක්ෂි ඇති අතර බෝධිසත්ව සංකල්පය ද මේ යුගයේ ජනප්‍රිය විය. මෙම තත්ත්වය තුළ මාලිගාවට නුදුරින් මෙවැනි විශ්වීය මණ්ඩලයක් හා උද්‍යානයක් නිර්මාණය කිරීම තුළින් රජුටත් රාජකීයයන්ටත් රටටත් ආරක්ෂාව බලාපොරොත්තු වූ බව පෙනේ.

**නිගමනය**

මෙම පර්යේෂණය තුළින් මතුවන සාධකයක් වන්නේ රන්මසු උයන හුදෙක් රාජකීයයන්ගේ සුඛ විහරණය සඳහා නිර්මාණය වන අතර ලාංකීය ඉංජිනේරු ශිල්පය හා බද්ධ වූ වාස්තු විද්‍යාව හා තාන්ත්‍රික බෞද්ධ ගුප්ත විශ්වවිද්‍යාව යන තත්ත්වයන් මනාව සුසන් යෝග වූ ස්ථානයක් බවයි.

**ප්‍රමුඛ පද -** තාන්ත්‍රික, රන්මසු උයන, ලෞකිකත්වය, විශ්වීය මණ්ඩලය, සක්වල චක්‍රය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*අනුරාධපුර වෙස්සගිරිය ලිපිය* - (IV මහින්ද) - EZ. Vol I P. 29-38

*මහාවංසය*, ප්‍රථම භාගය, (2015). ඤාණානන්ද හිමි. තරංජී ප්‍රින්ටර්ස්, මහරගම.

*ලංකා ඉතිහාසය - I කාණ්ඩය*, (සිංහල) I භාගය (2015). විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

*ලංකා ඉතිහාසය - I කාණ්ඩය, II* භාගය. (1971). විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

චිත්‍රානන්ද, සී. (2001). *පැරණි රජරට චාරිතාක්ෂණික ඥානය.* කතෘ ප්‍රකාශන.

රාහුල, ඩබ්ලිව්. *ලක්දිව බුදු සමයේ ඉතිහාසය*, වල්පොල රාහුල පදනම් භාරය, කොට්ටේ.